# ගම්මිරිස් වගාවේ මෑත කාලීන ප්‍රවණතා; 2000 - 2012 කාල සීමාව

ඩබ්. ජී. නිරෝෂා ශ්‍යාමාලී[1]

**සංක්ෂේපය**

ඈත ඉතිහාසයේ පටන් ම කුළුබඩුවක් වශයෙන් හා ඖෂධයක් වශයෙන් බොහෝ ජාතීන් විසින් යොදාගත් කුළුබඩු අතර රජා යනුවෙන් හැඳින්වෙන ගම්මිරිස් ශ්‍රී ලංකාවේ ද බහුලව යොදා ගන්නා භෝගය කි. මෙම අධ්‍යයනය තුළින් ගම්මිරිස් වගාවේ ඓතිහාසික පසුබිම, එහි වැදගත්කම, ගම්මිරිස් භාවිතයන්, ගම්මිරිස් වගාව පිළිබඳ ද්විතීයික දත්ත භාවිත කරමින් එහි නිෂ්පාදනය, පරිභෝජනය, ආනයන හා අපනයන මෙන්ම එහි මිල ගණන්වල වෙනස් වීම් පිළිබඳ ව සංඛ්‍යානමය විශ්ලේෂණයක් සිදු කර ඇති අතර ගම්මිරිස් වගාවේ අලෙවිකරණ මාධ්‍යයන් ද හඳුනා ගෙන ඇත. තව ද දත්ත විශ්ලේෂණය මගින් ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වෙළෙඳපොළ නිරන්තරයෙන් සමතුලිත තත්ත්වයෙන් පවතින බව හඳුනාගෙන ඇත.

**මුඛ්‍ය පදඃ** *ගම්මිරිස් නිෂ්පාදනය, වෙළෙඳපොළ, අලෙවිකරණය, පරිභෝජනය*

**හැඳින්වීම**

ලොව ඉතා පැරණි කුළුබඩුවක් වන ගම්මිරිස් බෝගය ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල වගා කරමින් අන්තර් ජාතික වෙළෙඳපොළ ද ආක්‍රමණය කර ඇති තත්ත්වයක් තුළ ලංකාවේ ගම්මිරිස් ඉල්ලුම සහ සැපයුම අතර අසමතුලිතතාවක් පවතින බවට විවිධ මතිමතාන්තර පසුගිය කාලයේ ඇති විය. මේ තත්ත්වයට හේතු විමසා බැලීම වැදගත් කාරණයක් වන අතර එම අවශ්‍යතාවය මුල් කොට ගෙන ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වෙළෙඳපොළේ පවත්නා සැබෑ තත්ත්වය විග්‍රහ කිරීම මෙම වාර්තාව මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත ය. ලෝකයේ කුළුබඩු අතුරින් ගම්මිරිස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 04 ඉක්මවන අතර ලෝක වෙළෙඳපොළේ වාර්ෂිකව අලෙවි වන කුළුබඩු අතුරින් වැඩි ම ප්‍රතිශතයක් හිමි වන්නේ ගම්මිරිස් සඳහා ය. (එසේ ඉහළ නිෂ්පාදිතයක් ඇති මෙම බෝගයේ වර්තමාන තත්ත්වය හඳුනාගැනීම ශ්‍රී ලාංකාවේ කුළුබඩු  අපනයන ක්ෂේත්‍රයේ යෙදී සිටින බොහෝ ආයතන මෙන් ම පුද්ගලයන්ට ද වැදගත් වේ.)

ගම්මිරිස් (Pepper) භෝගයේ නිජබිම වන්නේ දකුණු ඉන්දියාවේ නැගෙනහිර කලාපය යි. 02 වන ශතවර්ෂයේ දී පමණ ගම්මිරිස් භෝගය

---

[1]සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, nirosha0313@gmail.com

හඳුනාගෙන ඇති අතර ඉන්දියාවේ වැසියන් ආහාර පිසීම සඳහා භාවිත කළ මෙම භෝගය 15 වන සියවසේ දී ඉන්දියාව තුළ වගාවක් වශයෙන් ආරම්භ කොට ඇත. එහි මුල් ම අවස්ථාව වශයෙන් 1498 දී මලබාර් ප්‍රදේශයේ ගම්මිරිස් ප්‍රධාන කොට ගෙන වස්කෝ ද ගාමා විසින් කුළුබඩු වගාවක් ආරම්භ කළ අවස්ථාව හඳුනාගත හැකිවේ. මෙසේ ආරම්භ වූ ගම්මිරිස් වගාව 16 වන සියවස පමණ වන විට ලංකාව, ජාවා, සුමාත්‍රා, මැඩගස්කර් ආදී රටවල් වල ද වගාවක් වශයෙන් ආරම්භ කොට ඇති අතර පසුකාලයේ දී එය ලෝකයේ බොහෝ රටවලට ව්‍යාප්ත වී ඇත (උක්කුබණ්ඩා, 1999).

ගම්මිරිස් ඉන්දියාව, මලයාසියාව ආදී සර්ම කලාපීය දේශගුණයකින් යුක්ත රටවල හොඳින් වැවෙන ශාක වැල් විශේෂයක් වන අතර වර්තමානය වන විට කුළුබඩුවක් හා ඖෂධයක් පමණක් නොව අපනයන භෝගයක් ලෙස ද හැඳින් වේ. මිරිස් භාවිතයක් නොමැති ජාතීන් ද ගම්මිරිස් භාවිත කරන අතර විවිධ ජාතීන් විවිධ නම්වලින් ගම්මිරිස් හඳුන්ව යි. ඒ අනුව සංස්කෘත භාෂාවෙන් මරිච උෂ්ණ වශයෙන් ද, දෙමළ බසින් මෙලගු හා මිලාගු වශයෙන් ද හැඳින්වෙන ගම්මිරිස්වල ඉංග්‍රීසි නම Black Pepper හෙවත් Common Pepper වේ (උක්කුබණ්ඩා, 1999).

ලොව ඉතා පැරණි හා වැදගත් කුළුබඩු වර්ගයක් වූ මෙහි Piperine නම් උපක්ෂරයක් පවතින අතර ගම්මිරිස්වල ඇති කටුක රසය Chavicine නම් පදාර්ථය නිසා ද, ගම්මිරිස්වල සුවඳ එහි වාෂ්පශීලී තෛල පදාර්ථයේ ඇතුලත් Terpenes නිසා ද ලැබී ඇති අතර විවිධ රසායනික සංඝටක රාශියක් ගම්මිරිස් තුළ පවති (උක්කුබණ්ඩා, 1999).

ගම්මිරිස් ඇටය ලෙස හඳුන්වන එහි ඵලයේ අඩංගු ක්‍රියාකාරී සංයෝගය වන්නේ පයිපරින් නම් රසායනික පදාර්ථයකි. එය 2%-9% අතර ප්‍රමාණයක් ගම්මිරිස් ඇටය තුළ අඩංගු වේ. පයිපරින් යනු ඇල්කලොයිඩ් කාණ්ඩයට අයත් රසායනික ද්‍රව්‍යයක් වන අතර මෙයට අමතරව ගම්මිරිස් ඇටයේ විවිධ වාෂ්පශීලී තෙල්, මේදය හා ප්‍රෝටීන ආදී නොයෙක් රසායනික ද්‍රව්‍යය 100 කට අධික ප්‍රමාණයක් පවතින බව සැලකේ. ගම්මිරිස් තෙල්වල Terpenes, T-phellandrene, Caryophylle සමඟ Dipentene අඩංගු වේ. තෙල්වල ඇති ලාක්ෂණික සුවඳට හේතුව කුඩා ප්‍රමාණයෙන් අඩංගු Oxygented Compound ය. මෙහි Piperonal, Dhydrocarveol, Cryopyllene Oxide, Caryptone හා Alcohol ඇති බවට හඳුනාගෙන ඇත. ගම්මිරිස් වල තෙල් ප්‍රමාණය 3%ක් පමණ වේ. මෙහි A-pinine, b pinine, Di-limoneme, A-phellandrene, Caryophyllene, Piperonl, Crypone, Phenylacetic Acid, Piperidine, Citronellol yd Other Oxygenated Compounds කුඩා ප්‍රමාණයෙන් අඩංගු වේ. ගම්මිරිස් මුල් වල Essential Oil 0.39% හා ප්‍රධාන සංයෝගය ලෙස Caryophyllene

අඩංගු වේ. ගම්මිරිස්වල ප්‍රධාන තීක්ෂණ සංයෝගය වන්නේ Piprine [$C_{17}$,$H_{19}$ $O_3$ N] ය. මෙය 4.9% - 7.7%ක් ලෙස කළු ගම්මිරිස්වල ද, 5.5%-5.9% ක් ලෙස සුදු ගම්මිරිස්වල ද, අඩංගු වේ. එමෙන්ම ගම්මිරිස් වල සුවඳට හේතු වන essential oil ද කළු ගම්මිරිස් වල 1.0% – 1.8% දක්වාද සුදු ගම්මිරිස් වල 0.5% - 0.9% දක්වාද අඩංගු වේ (USDA National Nutrient Database, 2011).

වාර්ෂිකව මි. මි. 1750කට නො අඩු වර්ෂාපතනයක් ලැබෙන, මුහුදු මට්ටමේ සිට මීටර් 1000 ක් පමණ උස් ප්‍රදේශ ගම්මිරිස් වගාවට වඩාත් සුදුසු වන අතර සාමාන්‍යයෙන් $25^0$Cත් $35^0$Cත් අතර උෂ්ණත්ව පරාසයක හා දිනයේ උෂ්ණත්වය වෙනස් වීමේ උපරිමය $35^0$C සහ අවමය $12^0$C නො ඉක්මවන ප්‍රදේශ සහ හොඳින් හියුමස් ඇති හොඳින් දිය බසින ගැඹුරු ලෝම පස ගම්මිරිස් වගාව සඳහා සුදුසු ය. ගම්මිරිස් ප්‍රධාන වශයෙන් පැනියූර්, කුචින් සහ දේශීය වර්ණ ලෙස ප්‍රභේද 03 ක් යටතේ හඳුනා ගත හැකි අතර මේවාට අමතරව ජාවාරම්, සියම්, මොන්ඩෙක්, සිංගප්පූරු, පිනෙන්ගු වශයෙන් විවිධ ගම්මිරිස් වර්ග වෙළෙඳපොළෙහි දක්නට ලැබෙ යි (කීරියවත්ත, 2008).

ශ්‍රී ලංකාවේ අපනයන භෝග අතුරින් විශේෂ ස්ථානයක් ගන්නා ගම්මිරිස් දිවයින පුරා හෙක්ටයාර 37825 ක් පමණ වගා කර ඇති අතර ඉන් හෙක්ටයාර 6912 මාතලේ දිස්ත්‍රික්කයේ වගා කර ඇත. මාතලේ දිස්ත්‍රික්කයේ ද හතමූනාගල, අංකන්ද, වේරගම, අඹන්ගඟ, මහවෙල, උකුවෙල, පලාපත්වල, හුණුකැට ඇල, රයිතලාවෙල, පල්ලේපොල, ආදී ප්‍රදේශවල වැඩි ලෙස ව්‍යාප්ත වී ඇත, ඊට අමතරව මොණරාගල, තෙල්දෙණිය, රඹුක්කන, කෑගල්ල, බදුල්ල, මාවනැල්ල, මාතර, ගාල්ල, රත්නපුර සහ ඌව පළාතේ ඇතැම් ප්‍රදේශ වල ද ගම්මිරිස් ව්‍යාප්තව ඇත (උක්කුබණ්ඩා, 1999).

ඈත කාලයේ දී ඖෂධයක් වශයෙන් යොදාගත්ත ද වර්තමානය වන විට විවිධ නිෂ්පාදන කර්මාන්තයන් සඳහා බහුලව යොදාගන්නා රසකාරකයක් ලෙස ගම්මිරිස් හැඳින්විය හැකි අතර මෙම නිෂ්පාදන කර්මාන්තයන් සඳහා ගම්මිරිස් වෙළඳපොළට සැපයීමේ දී විවිධ ක්‍රම කීපයකට එය සිදු කරයි. ඒ අනුව කළු ගම්මිරිස්, සුදු ගම්මිරිස්, ගම්මිරිස් තෙල්, ගම්මිරිස් ඔලියෝරෙසින, කල් තබා ගත හැකි කොළ හා රතු පැහැ ගම්මිරිස්, විජලනය කළ ගම්මිරිස් හා කොළ හා රතු ගම්මිරිස් සෝස් වශයෙන් ගම්මිරිස් වෙළෙඳපොළට ඉදිරිපත් වේ (අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2012).

ලෝකයේ කුළුබඩු අතුරින් ගම්මිරිස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 04 ඉක්මව යි. ගම්මිරිස් වගා කරන රටවල් අතර වියට්නාමය, ඉන්දුනීසියාව, ඉන්දියාව, බ්‍රසීලය, චීනය හා මැලේසියාව ප්‍රධාන ස්ථානයක් ගන්නා අතර ලෝකයේ නිෂ්පාදනය වන මුළු ගම්මිරිස් ප්‍රමාණය වන මෙට්‍රික්ටොන් 334790 න්

88.6%ක් ම නිපදවන්නේ ද, ලෝක වෙළෙඳපොළට සැපයෙන මුළු ගම්මිරිස් ප්‍රමාණයෙන් 90% ක්ම සපයන්නේ ද, මෙම රටවල් විසිනි.

ගම්මිරිස් පරිභෝජනය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ලෝක පරිභෝජනය මෙට්‍රික් ටොන් 139383 (2013 දී) ක් වන අතර පරිභෝජනයේ දී යුරෝපය හා උතුරු ඇමරිකාව ප්‍රමුඛස්ථානය ගනී. රටක් වශයෙන් ගත් විට ඉන්දියාවෙන් ඉහළම ගම්මිරිස් පරිභෝජනයක් වාර්තා වේ. ඒ අනුව 1999 දී ඉන්දියාවේ වාර්තාගත ගම්මිරිස් පරිභෝජනය මෙට්‍රික් ටොන් 3000ක් වන අතර 2013 දී එය මෙට්‍රික් ටොන් 56154 කී. එය ලෝක ගම්මිරිස් පරිභෝජනයෙන් 40.28% ක තරම් ප්‍රතිශතයකි. මීට අමතරව වියට්නාමය, චීනය, ඉන්දුනීසියාව, බ්‍රසීලය,යන රටවල් ද ඉහළ ගම්මිරිස් පරිභෝජනයක් වාර්තා කරයි.

ගම්මිරිස් නිෂ්පාදනය කර අපනයනය කරන රටවල් අතර ප්‍රධාන ස්ථානයක් හිමිවන්නේ වියට්නාමයට යි. ලෝක වෙළෙඳපොළේ අපනයනය වන මුළු ගම්මිරිස් ප්‍රමාණය වන මෙට්‍රික් ටොන් 261174 න් 55.3%ක් ම අපනයනය කරනු ලබන්නේ වියට්නාමය යි. ඊට අමතර ව බ්‍රසීලය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව ආදී රටවල් ද ගම්මිරිස් අපනයනයේ යෙදී සිටි යි. ගම්මිරිස් ගැණුම්කරුවන් අතුරින් ප්‍රධාන ම ගැණුම්කරුවා වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදය යි. 1990 දී පමණක් ඩොලර් 200 ක වටිනාකමකින් යුත් ගම්මිරිස් ප්‍රමාණයක් එරට තුළ ට ආනයනය කර තිබෙයි. ගම්මිරිස් ගැණුම්කරුවන් අතරින් ජර්මනිය, ජපානය, ප්‍රංශය, එංගලන්තය, ඕස්ට්‍රේලියාව, නෝර්වේ, ස්වීඩනය, හා සෞදි අරාබිය යන රටවල් ද වැදගත් වේ. මෙම රටවල් මස් ඇසිරීම, ටින් කිරීම, අච්චාරු දැමීම, පැණිරස ආහාර වර්ග හා බීම වර්ග පිළියෙල කිරීම සඳහා වූ කර්මාන්ත ක්ෂේත්‍රයන් තුළින් ගම්මිරිස් සඳහා ඉහළ ඉල්ලුම් මට්ටමක් වාර්තා වේ.

මේ ආකාරයට ගම්මිරිස් භෝගය සහ අන්තර්ජාතික ගම්මිරිස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයන් හඳුනාගත හැකි අතර ගම්මිරිස් නිෂ්පාදනය කර අපනයනය කරන රටවලට සාපේක්ෂව කුඩා ප්‍රතිශතයක් හිමි වුව ද ශ්‍රී ලංකාවේ ද ගම්මිරිස් වගාව සැළකිය යුතු ප්‍රමාණයකින් ව්‍යාප්ත වී පවතී. තව ද ලෝක වෙළෙඳපොළට සැපයෙන ගම්මිරිස් ප්‍රමාණයෙන් 5.18%ක් පමණ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිතයන් වන අතර ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වන ගම්මිරිස් ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් යොදා ගන්නේ ද අපනයනය සඳහා ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගාවේ මෑත කාලීන තත්ත්වය පහත මාතෘකා යටතේ සාකච්ඡා කළ හැකි ය.

## ශ්‍රී ලංකාවේ ගම්මිරිස් නිෂ්පාදනය

කුළුබඩු අතුරින් ශ්‍රී ලංකාවේ වැඩිම භූමි ප්‍රමාණයක ව්‍යාප්ත වී ඇති භෝගයක් වශයෙන් ගම්මිරිස් දෙවැනි වන්නේ කුරුඳු වගාවට පමණක් වන අතර 2000 වර්ෂයේදී ගම්මිරිස් සඳහා හෙක්ටයාර 28438 ක් ව පැවති භූමි

ප්‍රමාණය 2012 වන විට හෙක්ටයාර 37825 ක් දක්වා 33% කින් වැඩි වී ඇත (උක්කුබණ්ඩා, 1999).

එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ගම්මිරිස් නිෂ්පාදනය ද 2000-2012 කාලය අතර දත්ත පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව 2000 දී මෙට්‍රික් ටොන් 16831ක් වූ නිෂ්පාදනය ක්‍රමිකව ඉහළ ගොස් 2012 වන විට මෙට්‍රික් ටොන් 25637ක් වී තිබේ.

වගුව 01. ශ්‍රී ලංකාවේ ගම්මිරිස් නිෂ්පාදනය (2000-2012)

| වර්ෂය | භූමි ප්‍රමාණය | නිෂ්පාදනය |
|---|---|---|
| 2000 | 28438 | 16831 |
| 2001 | 28472 | 17091 |
| 2002 | 29100 | 17697 |
| 2003 | 30029 | 17856 |
| 2004 | 31325 | 18561 |
| 2005 | 31150 | 18292 |
| 2006 | 30494 | 18601 |
| 2007 | 30517 | 19393 |
| 2008 | 34066 | 22870 |
| 2009 | 36180 | 25302 |
| 2010 | 37344 | 26622 |
| 2011 | 37629 | 26476 |
| 2012 | 37825 | 25637 |

මූලාශ්‍රයඃ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012

මෙලෙස ක්‍රමික වර්ධනයක් පෙන්වුව ද 2010 වර්ෂයට සාපේක්ෂව 2011 හා 2012 වර්ෂවල දී ගම්මිරිස් නිෂ්පාදනයේ පැවති ක්‍රමික වර්ධනයට හානි වී ඇත. තව දුරටත් සලකා බැලීමේ දී මෙම කාලය තුළ දී ලංකාවේ ඇතැම් දිස්ත්‍රික්කවල ගම්මිරිස් නිෂ්පාදනය අඩු වී ඇති බවත්, ඇතැම් දිස්ත්‍රික්කවල නිෂ්පාදනය වැඩි වී ඇති බවත් හඳුනාගත හැකි වේ. 2012 වාර්ෂික වාර්තාවලට අනුව 2000 වසරට සාපේක්ෂව 2012 දී මාතලේ 128.6%ක්, මොණරාගල 177.7%ක්, හම්බන්තොට 151.6%ක්, බදුල්ල 177%ක් හා රත්නපුර 192%ක් වශයෙන් නිෂ්පාදනය වර්ධනය වී ඇත. තවද 2000 දී වැඩි ම

ගම්මිරිස් නිෂ්පාදනයක් වන මෙට්‍රික් ටොන් 4724ක් නිපද වූ නුවර දිස්ත්‍රික්කයේ ගම්මිරිස් නිෂ්පාදනය 2012 වන විට 1.86%කින් අඩු වුව ද තවමත් අනිකුත් දිස්ත්‍රික්ක අතර ඉදිරියෙන් සිටී. නුවර දිස්ත්‍රික්කයේ නිෂ්පාදන ධාරිතාව අඩු වුව ද එයට සාපේක්ෂ ව අනිකුත් දිස්ත්‍රික්කයන්හි නිෂ්පාදනය ඉතා ඉහළ අනුපාතයන්ගෙන් වර්ධනය වී තිබීම හේතුවෙන් ලංකාවේ සමස්ත ගම්මිරිස් නිෂ්පාදනය 52.3% කින් ඉහළ ගොස් ඇත.

සාමාන්‍යයෙන් ගම්මිරිස් අක්කරයකින් අමු ඇට කිලෝ 2300ක ඵලදාවක් ලබාගත හැකි අතර වියළි ගම්මිරිස් කිලෝග්‍රෑම් 275ක් පමණ ලබාගත හැකි මුත් මේ ප්‍රමාණය සෑම වර්ෂයකම එක ලෙසට ව්‍යාප්ත නොවේ. 2000-2012 කාලය තුළ අක්කරයකින් ලබා ගත හැකි ගම්මිරිස් ප්‍රමාණය විවිධ උච්චාවචනයන්ට ලක් වී තිබේ. මේ අනුව 237.6 - 288.0 යන පරාසය තුළ අක්කරයකින් ලබාගත හැකි ගම්මිරිස් කිලෝ ප්‍රමාණය විසිර පවතින අතර එහි සාමාන්‍යය අගය කිලෝ 275 කි.

**ගම්මිරිස් පරිභෝජන**

ශ්‍රී ලංකාවේ ගම්මිරිස් පරිභෝජනය පිළිබඳව අවධානය යොමුකිරීමේ දී හෝටල් කර්මාන්තය තුළ වැඩි පරිභෝජනයක් දක්නට ලැබෙන අතර ඉතිරිය ගෘහස්ථ පරිභෝජනය සඳහා යොදා ගනී. අපනයනයෙන් පසුව ඉතිරි වන ප්‍රමාණය සහ ආනයනික ගම්මිරිස් ප්‍රමාණය දේශීය වෙළඳපොළ තුළ බෙදා හැරෙයි. ඒ අනුව 2000 වර්ෂයේ දී ඒක පුද්ගල මාසික ගම්මිරිස් පරිභෝජනය ග්‍රෑම් 16.6ක්ව පැවති මුත් 2010 දී එය ග්‍රෑම් 23.22ක් දක්වා 39.8% කින් වර්ධනය වී තිබේ. එමෙන් ම මෙම කාලය තුල දී ලංකාව තුළ ගම්මිරිස් පරිභෝජනයේ පැවති උච්චාවචන තත්ත්වය පහත රූප සටහන තුළින් මනා ව පැහැදිලි වේ.

ප්‍රස්තාර සටහන 02: ගම්මිරිස් පරිභෝජනයේ උච්චාවචනයන් (2000-2012)




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012

මෙහි දී වසර 2000 සිට 2002 වසර දක්වා ගම්මිරිස් පරිභෝජනයේ ශීඝ්‍ර වර්ධනයක් හඳුනාගත හැකි වුව ද 2002 වසරේ සිට 2012 දක්වා අතර කාලයේ දී ගම්මිරිස් පරිභෝජනයේ සැළකිය යුතු උච්චාවචනයක් දක්නට නොලැබෙන අතර එහි ක්‍රමික විකාශනයක් හඳුනාගත හැකි වේ. ඒ අනුව වර්ෂයෙන් වර්ෂයට වැඩිවන ජනගහනයත් සමග ගම්මිරිස් පරිභෝජනය ද ඉහළ ගොස් ඇති බව මෙයින් ප්‍රකාශ වේ.

**ගම්මිරිස් අපනයනය හා ආනයනය**

ශ්‍රී ලංකාව දීර්ඝ කාලයක් තිස්සේ කුළුබඩු අපනයනයට යොමු වී තිබෙන අතර ගම්මිරිස් නිෂ්පාදනය පිළිබඳව විමසා බැලීමේ දී සමස්ත ගම්මිරිස් නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් අපනයනය සඳහා යොදා ගන්නා බවත්, ගම්මිරිස් අපනයනයෙන් විශාල විදේශ විනිමයක් රටට ගලා එන බවත්, හඳුනාගත හැකි වේ.

වගුව 02. ගම්මිරිස් ආනයනය හා අපනයනය (2000-2011)

| වර්ෂය | අපනයනය(Mt) | ආනයනය(Mt) |
|---|---|---|
| 2000 | 4855.26 | 53.61 |
| 2001 | 2161.86 | 12.43 |
| 2002 | 7589.11 | 30.76 |
| 2003 | 7740.80 | 148.09 |
| 2004 | 4851.62 | 33.79 |
| 2005 | 8053.90 | 42.71 |
| 2006 | 8191.33 | 68.71 |
| 2007 | 9015.36 | 112.37 |
| 2008 | 6236.76 | 95.78 |
| 2009 | 6585.89 | 61.56 |
| 2010 | 12218.85 | 62.27 |
| 2011 | 5036.76 | 25.44 |
| 2012 | 10487.35 | 3.97 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු අධිකාරිය, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012

මේ අනුව වසර 2000 සිට 2012 අතර කාලය තුළ දී ඉහළම ගම්මිරිස් අපනයනයක් 2010 වර්ෂයේදී වාර්තා වී තිබෙන අතර 2001 දි අඩු ම අපනයනය ප්‍රමාණයක් (මෙට්‍රික් ටොන් 2161.86) වාර්තා වී තිබෙ යි. එමෙන් ම වරින් වර ගම්මිරිස් අපනයනය විවිධ උච්චාවචනයන්ට බඳුන් වී ඇති අතර එහි ක්‍රමික වර්ධනයක් ද පෙන්ව යි. ඒ අනුව 2000 වර්ෂයට සාපේක්ෂව 2012 වන විට ගම්මිරිස් අපනයනය 115.9% කින් වර්ධනය වී

ඇත. තව ද 2011 වර්ෂයේ දී අපනයනයේ දැඩි කඩාවැටීමක් පෙන්වන අතර එය ඉහළ ම අපනයනයක් පෙන් වූ 2010 වසරට සාපේක්ෂ ව 142.6% ක කඩා වැටීමකි. 2010 වසරට වඩා 2012 දී අපනයන ප්‍රමාණය අඩු වුව ද ලෝක වෙළඳපොළේ ගම්මිරිස් සඳහා වන මිල ඉහළ යාම හේතුකොට ගෙන ඉහළ ම අපනයන වටිනාකම වන රුපියල් 8904385.08 (000) ක් 2012 වර්ෂයේ දී ලබාගෙන ඇත. එසේ නම් මේ තත්ත්වය අනාගතයේ ගම්මිරිස් වගාව වඩාත් ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා කරන පෙළඹවීමක් වශයෙන් හඳුනාගත හැකි වේ.

අපනයනයෙන් පසු ව ඉතිරි වන ගම්මිරිස් ප්‍රමාණය දේශීය වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් එම අධි ඉල්ලුම සමනය කිරීම සඳහා වෙනත් රටවලින් ගම්මිරිස් ආනයනය කිරීම සිදු වේ. ඒ අනුව 2000 වර්ෂයේදී ගම්මිරිස් මෙට්‍රික් ටොන් 53.61 ආනයනය කොට ඇත. නමුත් ලංකාවේ ගම්මිරිස් නිෂ්පාදනයේ සාධනීය වෙනස හේතුවෙන් වර්තමානය වන විට ආනයනය කරන ගම්මිරිස් ප්‍රමාණය පහළ බැස ඇති අතර 2012 දී එම පහළ බැසීම 2000 වසරට සාපේක්ෂව 135.0%ක පහළ බැසීමකි. ඒ අනුව ගම්මිරිස් ආනයනය සඳහා වැය වන දේශිය විනිමය විශාල ප්‍රමාණයක් ලංකාවේ ඉතිරි වීම මඟින් ආර්ථිකයට වාසිදායක තත්ත්වයක් උදාකරනු ලබ යි.

මේ ආකාරයට ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වෙළෙඳපොළේ විවිධ තත්ත්වයන් හඳුනාගත හැකි අතර ගම්මිරිස් ලැබීම් හා වැයවීම් අතර සමතුලිතතාවක් පවතී ද? නැතිනම් අධි ඉල්ලුමක් හෝ අධි සැපයුමක් පවතී ද යන්න හඳුනාගැනීම ද ඉතා වැදගත් වේ. එහිදී 2000 වසරේ 2012 දක්වා සෑම වර්ෂයක දී ම ලංකාවේ අන්තර්ජාතික ගම්මිරිස් වෙළෙඳපොළ තුළ අධි ඉල්ලුම් තත්ත්වයක් හඳුනාගත හැකි වේ. උදාහරණයක් වශයෙන් 2000 දි ගම්මිරිස් නිෂ්පාදනය හා ආනයන වල එකතුවෙන් සැකසෙන ලැබීම් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 16884.61ක් වන අතර පරිභෝජනයට හා අපනයනයට යොදාගෙන ඇත්තේ මෙට්‍රික් ටොන් 8711.52 ක ප්‍රමාණයකි. ඒ අනුව මෙට්‍රික් ටොන් 8173.04ක අතිරික්තයක් පවතී. 2010 දී මේ තත්ත්වය 8710.67කි. එසේ නම් මෙවන් තත්ත්වයක් ඇතිවීමට හේතු විමසා බැලීම අනිවාර්ය කරුණකි. එහි දී පෙනී යන්නේ ලංකාවේ නිෂ්පාදිත හා ආනයනික ගම්මිරිස්වලින් පරිභෝජනයට හා අපනයනයට යොදා ගැනීමෙන් අනතුරුව රට තුළ ඉතිරි වන අතිරික්තය විවිධ කාර්යයන් සඳහා යොදා ගන්නා බව යි. විශේෂයෙන් ම පරිභෝජනය තුළ ඇතුලත් වන්නේ ගෘහස්ථ පරිභෝජනය සඳහා යොදාගන්නා ප්‍රමාණය පමණක් බැවින් අතුරු නිෂ්පාදනයන් සඳහා යොදාගන්නා ප්‍රමාණයන් ඉහත ගණනය කිරීම්වලට හසු වී නොමැත. තවද හෝටල්, රෝහල්, නේවාසිකාගාර ආදිය සඳහා යොදා ගන්නා ප්‍රමාණය, අස්වැන්නෙන් විනාශ වන ප්‍රමාණය හා අපතේ යන ප්‍රමාණය ආදිය ද ඉහත ගණනය කිරීම්වලට ඇතුළත් කොට නොමැති වීම මෙවන් අතිරික්තයක් පෙන්වීමට හේතු වී ඇත.

### ගම්මිරිස් මිල

ලෝක වෙළෙඳපොළේ ගම්මිරිස් සඳහා වන මිල ගණන් වල සිදුවන උච්චාවචනයන් හේතුකොට ගෙන ශ්‍රී ලංකා වෙළෙඳපොළ තුළ ද ගම්මිරිස් වල මිල ගණන් වරින් වර වෙනස් වී තිබෙන බව හඳුනා ගත හැකි වේ. වර්තමානය වන විට ගම්මිරිස් කිලෝවක මිල රුපියල් 1000කට ආසන්න ව පවතී. 2000 වසරේ සිට 2012 දක්වා කාලය තුළ අඩුම මිල මට්ටමක් 2004 වර්ෂයේදී වාර්තා වන අතර එයට සාපේක්ෂව 2012 දී 318% කින් මිල ඉහළ ගොස් ඇත. එමෙන් ම 2011 වර්ෂයේ දී පැවති මිල මට්ටම වන රුපියල් 597.29ට සාපේක්ෂ ව 2012 දී එය 51%කින් ඉහළ ගොස් ඇත.

එමෙන් ම ලංකාවේ එක් වර්ෂයක් තුළ වුව ද විවිධ මාසවල දී එකිනෙකට වෙනස් මිල ගණන් වාර්තා වන අතර එය මිල ගණන් වෙනස් වීමේ ඍතුමය දර්ශකය ගණනය කිරීම මගින් පැහැදිලි ව අවබෝධ කර ගත හැකි ය.

වගුව 03. වසරක ගම්මිරිස් මිල වෙනස් වීමේ ඍතුමය දර්ශකය

| මාසය | ඍතුමය දර්ශකය |
|---|---|
| ජනවාරි | 97.46 |
| පෙබරවාරි | 97.78 |
| මාර්තු | 96.95 |
| අප්‍රේල් | 97.42 |
| මැයි | 98.51 |
| ජුනි | 99.47 |
| ජූලි | 99.57 |
| අගෝස්තු | 99.66 |
| සැප්තැම්බර් | 100.38 |
| ඔක්තොම්බර් | 103.19 |
| නොවැම්බර් | 103.30 |
| දෙසැම්බර් | 106.29 |

මූලාශ්‍රයː ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012

ඉහත ආකාරයට වසරේ විවිධ මාස අතර ද ගම්මිරිස් සඳහා වන මිලගණන් වෙනස් වන අතර ඉහළ ම මිලක් වාර්තා වන්නේ දෙසැම්බර් මාසයේදී ය. එමෙන්ම මාර්තු මාසයේ දී පහළ ම මිලක් වාර්තා වන අතර එම මිලේ වෙනස් වීම ඉහළම මිලට සාපේක්ෂ ව 9.6%ක අගයක් ගනී.

**ගම්මිරිස් අලෙවිකරණය**

යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමෙන් අනතුරුව එම නිෂ්පාදිතය පාරිභෝගිකයා අතට පත් කිරීමේ ක්‍රියාවලිය අලෙවිකරණය වශයෙන් හැඳින්වෙන අතර මේ සඳහා පුද්ගලයන් හෝ ආයතන කිහිපයක් මැදිහත් වේ. විශේෂයෙන්ම කෘෂි අලෙවිකරණ නාලිකාවක් යනු ගොවිපොළේ සිට පාරිභෝගිකයා දක්වා කෘෂි නිෂ්පාදන මෙහෙය වනු ලබන මාර්ගය යි. මෙහි දීර්ඝත්වය එනම් නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා මෙහෙය වීම කොපමණ අතරමැදියන් සංඛ්‍යාවක් හරහා සිදුවේ ද යන්න තීරණය වීම සඳහා කෘෂි නිෂ්පාදනයේ, වර්ගය සහ ප්‍රදේශය, නිෂ්පාදිත රට හා කාල වකවානුව, වෙනත් සාධක (කෘෂිකර්මය වාණිජකරණය වීම) යන සාධක බලපානු ලබ යි.

වර්තමානයේ ලංකාව තුළ ප්‍රධාන අපනයන භෝගයක් බවට පත්ව ඇති ගම්මිරිස් සඳහා පවතින අලෙවිකරණ නාලිකාව පහත පරිදි වන බව ගම්මිරිස් වෙළෙඳපොළ නිරීක්ෂණයෙන් පැහැදිලි වේ.

සටහන 01: ගම්මිරිස් සඳහා පවතින  අලෙවිකරණ නාලිකාව




ඉහත නාලිකාව දෙස බැලීමේ දී ගම්මිරිස් නිෂ්පාදිතය ගොවිපොළේ සිට පාරිභෝගිකයා අතට පත් වන තුරු ගම්මිරිස් වෙළෙඳපොළේ සිටින විවිධ පාර්ශවයන් විවිධ ස්වරූපයෙන් ඒ සඳහා මැදිහත් වන බව හඳුනාගත හැකි

අතර ඔවුන්ගේ මැදිහත් වීම හේතුවෙන් ගම්මිරිස් සඳහා පවතින මිල ගණන් වෙනස් වන ආකාරය ද විමසා බැලිය යුතු වේ.

මෙහි දී ගම්මිරිස් සඳහා වන නිෂ්පාදන මිල සහ ගම්මිරිස් අලෙවි වන මිල ගණන් පිළිබඳව සලකා බැලිය යුතු වේ. ඒ අනුව 2000 දී ගම්මිරිස් කිලෝ 01ක සාමාන්‍ය නිෂ්පාදන මිල රුපියල් 283.05ක් වන අතර වෙළෙඳපොළ මිල රුපියල් 404.27ක් වේ. එහි දී මෙම මිල ගණන් 02 අතර වෙනස වන රුපියල් 121.22ක ප්‍රමාණය වෙළෙඳපොළේ සිටින විවිධ පාර්ශව අතර බෙදී යයි. එමෙන් ම 2012 දී නිෂ්පාදන මිල රුපියල් 606.2ක් ද වෙළෙඳපොළ මිල රුපියල් 902.3ක් ද වේ. මෙහි දී ද රුපියල් 296.1ක ප්‍රමාණයක් අතරමැදියන් අතර බෙදී යයි. මේ අනුව 2000-2012 දක්වා කාලය තුළ ගම්මිරිස් නිෂ්පාදන මිලේ සහ වෙළෙඳපොළ තුළ අලෙවි වන මිලේ හැසිරීම පහත සටහන මඟින් දැක් වේ.

වගුව 04. ගම්මිරිස් මිල වෙනස් වීම

| වර්ෂය | නිෂ්පාදන මිල | අලෙවි මිල |
|---|---|---|
| 2000 | 283.05 | 404.27 |
| 2001 | 226.53 | 342.65 |
| 2002 | 170.61 | 291.13 |
| 2003 | 136.20 | 230.83 |
| 2004 | 140.78 | 215.82 |
| 2005 | 132.90 | 219.43 |
| 2006 | 151.40 | 241.91 |
| 2007 | 280.43 | 391.31 |
| 2008 | 328.11 | 543.12 |
| 2009 | 300.43 | 571.67 |
| 2010 | 319.85 | 597.29 |
| 2011 | 606.20 | 902.31 |

මූලාශ්‍රයඃ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මේ ආකාරයට සලකා බැලීමේ දී පෙනී යන්නේ ගම්මිරිස් නිෂ්පාදන මිල වරින් වර උච්චාවචනයන්ට බඳුන් වී ඇති බවත්, එම මිල අඩු වන විට එයට සාපේක්ෂව ගම්මිරිස් වල සිල්ලර මිල වෙනස් වී ඇත්තේ 2003 වර්ෂයේ දී පමණක් බවත් අන් සෑම වර්ෂයකදී ම නිෂ්පාදන මිලේ අඩු වීම

හෝ වැඩි වීම නොසලකා අලෙවි කරුවන් තම අලෙවි මිල වැඩි කිරීම මඟින් එහි ක්‍රමික වර්ධනයක් පවත්වාගෙන ඇති බවත් ය.

**සමාලෝචනය**

ගම්මිරිස් වර්තමානය වන විට අන්තර්ජාතික වෙළෙඳාම හා සම්බන්ධ වූ ඉතා වැදගත් භෝගයක් වේ. ලෝකයේ බොහෝ රටවල ගම්මිරිස් වගා කරනු ලබන අතර අන්තර්ජාතික වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය මඟින් ගම්මිරිස් සඳහා මිල තීරණය වේ. ගම්මිරිස් නිෂ්පාදනය කර අපනයනය කරන රටවලට සාපේක්ෂව කුඩා ප්‍රතිශතයක් හිමි වුව ද ශ්‍රී ලංකාවේ ද ගම්මිරිස් වගාව සැළකිය යුතු ප්‍රමාණයකින් ව්‍යාප්ත වී පවතින අතර වර්තමානය වන විට ලංකාවේ ගම්මිරිස් නිෂ්පාදනය වර්ධනය වී ඇත. මේ හේතුවෙන් අපනයනය කරන ගම්මිරිස් ප්‍රමාණය ද මේ වන විට පහළ ගොස් තිබෙන අතර මෙම සාධනීය වෙනස නිසා ම ගම්මිරිස් ආනයනය ශීඝ්‍රයෙන් පහළ බැස ඇත. ශ්‍රී ලංකා වෙළෙඳපොළ තුළ ද ගම්මිරිස්වල මිල ගණන් වරින් වර වෙනස් වී තිබෙන බව හඳුනා ගත හැකි වේ. වර්තමානය වන විට ගම්මිරිස් කිලෝවක මිල රුපියල් 1000කට ආසන්නව පවතින අතර මෙය වසරින් වසරට වෙනස් වන බවත් එකම වර්ෂයක් තුළ වුව ද විවිධ මාසවල දී ගම්මිරිස් මිල වෙනස් වී දෙසැම්බර් මාසයේ දී ඉහළ ම මිලක් වාර්තා වන බවත් හඳුනාගත හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. (2012). ගම්මිරිස් වගාව හා අස්වනු සැකසීම. *කාර්මික ප්‍රකාශනය-04.* බත්තරමුල්ලඃ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. (2010). *දිවි නැගුම.* කෘෂිකර්ම අත් පත්‍රිකා අංක 10. කොළඹඃ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ඖෂධීය ශාක සංග්‍රහය. (1999). *ශ්‍රී ලාංකේය අධ්‍යයනයක්,* දෙවන වෙළුම, මහරගමඃ ආයුර්වේද දෙපාර්තමේන්තුව.

කරුණානන්ද යූ. (1999). *ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය. බ්‍රිතාන්‍යය පාලන යුගය 1796-1931.* කඩවතඃ අභය මුද්‍රණ.

කීරියවත්ත, සී. ආර්. එස්. (2008, දෙසැම්බර් 12). සාර්ථක ගම්මිරිස් වගාවකට උපදෙස්. *ලංකාදීප.*

නෝනිස්, බී. (2007). ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වෙළෙඳපොළ. *අස්වැන්න.* 26 අප්‍රේල්.

වටවල, ආර්. (2010, අප්‍රේල් 27). කුළුබඩු රජු ගම්මිරිස්. *දිවයින.*

Spices Board India. (2012). *Pepper*. Retrieved from http://www.indianspices.com/html/s062bppr.htm

United States Department of Agriculture. (2011). *USDA National Nutrient Database.* Retrieved from http://.Faostat.fao.org/site/339/default.aspx